

# කලාව සහ මත්පැන්

අප රටේ ජනප්‍රිය ගී කලාවේ තවත් මුදුන් මල් කඩක් වු ග්‍රේෂන් ආනන්ද මෑතකදී අප අතරින් සමු ගත්තේය. එහෙත් ඔහුගේ ගීතයට, සංගීතයට වු සේවාවට වඩා මිනිසුන් අතර වැඩිපුරම කතාබහට ලක්වුයේ ඔහුගේ බීමත් කමයි. බීමත්කම නිසා මියගිය දේශපාලකයන් අප රටේ විරලය. ඔවුන් කොතරම් බොනවාද. ඒ වෙනුවෙන් කෙතරම් මුදලක් යට කරනවාද යන්න අප කිසිවෙක් දන්නේ නැත. එසේ මිය ගියත් මිනිසුන් කතාකරන්නේ ඔහුගේ හොඳ හෝ නොහොඳ දේශපාලනය ගැනයි.

## කුට්ටම් පොකුණ



**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

කලාකරුවා සින්දු කියන්නේ අක්මාවෙනි. දේශපාලකයා සින්දු කියන්නේ හදවතෙනි. ඒ වෙනස කලාකරුවා දන්නේ නැත.

ග්‍රේෂන් ආනන්ද ශ්‍රිලනිප වේදිකාව වෙනුවෙන් එම පක්ෂය වෙනුවෙන් ගී ගැයු මිනිසෙකි.

ඈත ගම් දනව්වල රැස්වීම අවසානයේ ගී ගයන ග්‍රේෂන්ගේ සාක්කුවට අරක්කු බාගයක් දමා බසයේම ගෙදරට පිටත් කරන දේශපාලකයෝ ඊට පසු ඔහු උන්නාද මළාද කියා නොදනිති. මීට වසර 25කට පමණ කලින් දර්ශන වනිගරත්න චිත්‍ර ශිල්පියාගේ නිවසේදී ග්‍රේෂන් මට මුණ ගැසුණේය. ඒ ඔහුගේ කැසට් කවරයක කටයුත්තක් සඳහාය. එවෙලෙහි ද දර්ශනගේ නිවසේ තිබු ගිටාරයක් අතට ගෙන එහි තත් පරීක්ෂා කර එය වාදනය කළ ඔහු නිහඬ සුන්දර මිනිසෙකි. එකල සිටම තදින්ම "බොනපාටිකරණයට" අසුවී සිටි ග්‍රේෂන් වැනි කලාකරුවන් කාටත් පහසුවෙන් රවටා ග. හැකි පුද්ගලයෙක්ය. ඔහුට කලාව නිසා අහිමි වු දේ බොහෝය. බෙබදුකම නිසාද අහිමි වු දේ ඊටත් බොහෝය. ඒ තමාගේ සුන්දර කැදැල්ලයි.

බීමත්කම නිසා තම ජිවිතය කෙටි කරගත් කලාකරුවා වන්නේ ග්‍රේෂන් පමණක් නොවේ. එච්. ආර්. ජෝතිපාල, මිල්ටන් පෙරේරා, ගුණදස කපුගේ, ක්ලැරන්ස්, මිල්ටන් මල්වාරච්චි ආදී ප්‍රතිභාපුර්ණ කලාකරුවන් රැසක් එම ගනයට වැටෙයි. එහෙත් අවාසනාවට ග්‍රේෂන් ඒ කතිතාවතට වැඩිපුරම භාජනය විය.

ජෝතිපාල මියගියේ ගම් උදාව සංගීත සන්දර්ශනයකට ගී ගයමින් සිටින අතර තුර හදිසියේම අසනීප වු නිසාය. ඔහුගේ මරණයේදී විජය කුමාරතුංග කලාකරුවා ජෝති මැරුණා නොවේ මරාගත්තා යන වදන් පෙළ කීවේ කෙළින්ම එවකට අගමැතිව සිටි ප්‍රේමදාසට ඇනුම් පදයක් ලෙසිනි. එහෙත් රටේ ජනතාව ජෝතිගේ මරණය පිළිබඳව බීමත්කම අමතක කරමින් දැඩිව ශෝකී වුයෝය. ඒ ඔහු කෙතරම් බීවත් ජනතාවට දැනෙන්නට ගීත ගැයු නිසාය. ගුණදස කපුගේද එලෙසමය. විශ්ව විද්‍යාලවල සේම වන්නි හත් පත්තුවේද ගොවි ජනතාව වෙනුවෙන් නොමිලයේ ගී ගැයු කපුගේ මුදල් සරිකර ගත් කලාකරුවෙක් නොවේ. ඔහු ද බීමත් කම සරිකරගත් ශ්‍රේෂ්ඨ කලාකරුවෙකි. වරක් රූපවාහිනි සංවාදයකට සහභාගී වු කපුගේ ඔහුගේ ගීත කලාව සේම මෙතෙක් ආ ගමන් මග පිලිබඳව වැඩසටහනක නිරත වුයේය.

එම සංවාදයට ඔහුගේ මව ද සහභාගී වී සිටියේය. දුරකථනයෙන් ඔහු ඇමතු ප්‍රේක්ෂකයෙක් ඉල්ලීමක් කළේය. ඔබවැනි සුන්දර ශ්‍රේෂ්ඨ කලාකරුවක් ඇයි ඔච්චර මත් පැනට ලොල් වී ඉන්නේ රටේ ජනතාව වෙනුවෙන් තම මවගේ හිසට අත ගසා අදින් පසු බොන්නේ නැති බව දිව්රන්න කියා ඔහු ඉල්ලා සිටියේය. එවෙලෙහි ඔහුගේ දෙනෙතින් කඳුළු කැට කඩා පැන්නේය. ඔහු අඬමින් විනාඩි කිහිපයක් නිහඬව සිටියේය.

ඇම්. ඇස් ප්‍රනාන්දු බිමත්කම නිසා බාර්වලින්ද ගුටි කෑ කලාකරුවෙකි. මිල්ටන් පෙරේරා කානුපල්ලේ වැටෙන තෙක් බිව් කලාකරුවෙකි. එහෙත් කෙතරම් බණ දේශනා කළත් කෙතරම් පලවිපාක කියාදුන්නත් කලාකරුවන්ට සේම සාමාන්‍ය, උගත්, නුගත් සෑම මිනිසෙකුම එගොඩ මෙගොඩ හඳුනාගත නොහැකි මෙම බේබදුකම පෙර රජ දවස සේම බුදුන් උපදින්නත් පෙර සේම එන සමාජ පිළිළයකි. දේවදත්ත නාලාගිරි ඇතාට රා පොවා බුදුන්ට අනතුරක් කිරිමට අර ඇන්දේ රහ මෙරෙහි ආනිසංශ ඔහු කදිමට දන්නා නිසාය. නාලාගිරි ඇ.ා රා බිව්වේ උ9 එය මත්පැන් බව නොදැනය. ගසකින් පෙරී එන තෙලිජ්ජ උගේ ආහාරයක් වන්නට ඇත. එහෙත් සත්වයා මිනිසාට වඩා බුද්ධිමත් වන්නේ වර්තමානයේ සැර මත්පැන් සතුන්වත් පානය කරන්නේ නැති නිසාය. නමුත් මිනිසා එතනින් පල්ලමට වැටී ඇත.

සමහර කලාකරුවන් දේශපාලකයන් පසුපසයන්නේ "දෙකක් දාගෙන" සින්දු කියන්නටය. තවත් සමහරුන් හෙංචයින් වන්නේ වෙන වෙන වාසි තකාය. එහෙත් බොහෝ කලාකරුවන්ට දෙකක් දා ගන්නට ලැබුනොත් වෙන වෙන දේවල් ලැබෙන්නේ බොහෝ කලාතුරකිනි. නිවසක හීනයක් සැබෑකරගැනීමට, දේශපාලකයන්ට ලිපි ලියු ග්‍රේෂන් අන්තිමේදී වෙනයම් පුද්ගලයන් ලබාදී එම සිහිනය සැබෑකරගැනීමට උත්සාහ ගත්තේය. එහෙත් මිට යන තෙක්ම ඔහුට ලැබුණු නිවසක් නැත.

මෑතකදී වසර 80ක් සම්පුර්ණ කළ සිරිල් වික්‍රමගේ නමැති ප්‍රතිභාපුර්ණ රංගවේදියා කලාකරුවන්ට කදිම පණිවිඩයක් නිකුත් කළේය. ඒ දේශපාලකයන් පසු පස යන කලාකරුවන් ඒ පිළිබඳව දෙවරක් සිතා බැලිය යුතු බවයි. දේශපාලකයන් පසු පස ගොස් පරිණත අත්දැකීම් සම්භාරයක් ඇති සිරිල් වික්‍රමගේ එම වදන් පෙළ පිළිබඳව කලාකරුවන් දැඩි සැළකිල්ලක් ගත යුතු බන මාගේ

> ***කලාවට සේවයක් කිරීමට යැයි කියමින් දේශපාලකයන් පසුපස ගොස් පාර්ලිමේනතුවට එන කලාකරුවන් මෙතෙක් කලාවට කළ සේවාවක් නැත.***

අදහසයි. ඔහු පමණක් නොව ප්‍රේමසිරි කේමදසද අද ජිවතුන් අතර සිටියානම් එම දේම කියනු ඇත.

කලාවට සේවයක් කිරීමට යැයි කියමින් දේශපාලකයන් පසුපස ගොස් පාර්ලිමේනතුවට එන කලාකරුවන් මෙතෙක් කලාවට කළ සේවාවක් නැත. තමාට සේවාවක් කරගත්තත් කලාවට ඔවුන් ගෙන් මෙතෙක් සේවයක් සිදු වී නැත. අන්තිමේදී ඔවුන්ට මියයන්ට සිදුවන්නේද ජනතාවගේ ආදරයට පාත්‍ර වු කලාකරුවෙක් මෙන් නොව ජනතාවගෙන් ඈත් වු දේශපාලකයකු ලෙසයි.

ඈත අතීතයේ බිමත්කම නිසා රජකම අහිමි වු රජවරු සිටියත් අද දවස එවැනි රජවරු සහ දේශපාලකයන් බිහිවන්නේ නැත. එවැනි එජවරු පහළ වුවත් ලෝකයට දැනෙන්නේද නැත. අද ලෝකයේ අරක්කු මිළ වැඩිවුවත් බදු ආදායම වැඩි වෙනවා මිස නොබොන මිනිසුන් අඩුවන්නේ නැත. සුරාබදු බලපත්‍ර හිමි බොහෝ දේශපාලකයන් එම රස හොඳින් දන්නේය. එසේ විතරක් නොව වටලන හොර අරක්කු තිප්පලවලින් කෙතරම් බොන මිනිසුන් ප්‍රමාණයක් සිටීද යන්න කාටත් හොඳින් වැටහෙන්නේය. රුපියල් දස දහස් ගණන් වියදම් කරමින් රජයට ආදායම ලබාදෙන මිනිසුන්ගෙන් අයකරන රෝහල් ගාස්තුවට වඩා තැබෑරුමක් ආරම්භ කිරීමට ලබාදෙන බලපත්‍රය පිළිබඳව රජය මීට වඩා උනන්දු වුවා නම් සියලුම මත්පැන් හල් වසා දමා සුරාවෙන් තොර ධර්ම රාජ්‍යයක් බවට පත්කරන්නේන් නම් කලාකරුවාත් සාමාන්‍ය මිනිසාත් ආරක්ෂා වේ යැයි මට සිතේ. යම්තරමකින් එය ආරක්ෂා කරගත්තත්, මිනිස් සිත මත්පැන් සමඟ ඇති බැඳීම කිසිදා වෙන්කළ නොහැක. එය රෝහල් ගාස්තුවකින්ද නතර කළ නොහැක. එය මල හා බඹරා සේ සදාකල් පවතී. කලාවත් බීමත්කමත් එලෙසමය.

බීමත් කමින් රෝහල් ගත කරන ජනයාගෙන් රෝහල් ගාස්තුවක් අය කිරීමට සෞඛ්‍ය ඇමතිවරයා තීරණය කළේ මෑතකදීය. හදිසියේම අසනීප වු ග්‍රේෂන් ආනන්දව ඇතුලකලේ පෞද්ගලික රෝහලකටය. පෞද්ගලික රෝහල්වලට ඇතුලත් කරන සියලු දෙනාම මුදල් ගෙවිය යුතු නිසා සෞඛ්‍ය ඇමතිවරයාට ඒ පිළිබඳව ප්‍රශ්නයක් ද නැත. එසේම අප රටේ බහුතරයක් දේශපාලකයන් ප්‍රතිකාර ගන්නේ විදේශ රෝහල් හෝ ලංකාවේ පෞද්ගලික රෝහල් වලින් නිසාත්, බීමත් කමින් හෝ ඔවුන් අසනීප වුවහොත් ඔවුන්ට එම ගාස්තු ගෙවීමට හැකි නිසාත්, ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැත. ආණ්ඩුවේ මුදල්වලින් හෝ බිල් ගෙවීමට හැකි දේශපාලකයන්ට බීමත්කමද ප්‍රශ්නයක් නැත. මන්ද? ඔවුන්ගේ සෑම සාදයකදීම සින්දු කියන්නේ බීමතින්ය. ඒ නිසා මින් මත්තට බේබද්දන් වන කලාකරුවන් ප්‍රවේශම් විය යුතුය. යම් හෙයකින් ඔවුන් රජයේ රෝහලකට ඇතුල් කළ හොත් බිල් ගෙවිය යුතු නිසාය. එහෙත් ඔවුන් සින්දු කියමින් බීමතින් නටන දේශපාලකයාට ඒ පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් නැත.

**කොළඹට නුදුරු**
**නිස්කලංක නවාතැනක්**

මව්බිමට නිවාඩුවක් ගතකිරීමට යන ඔබට සුවපහසු නවාතැනක් කොලඹට නුදුරු අතුරුගිරිය ප්‍රදේශයෙන් ආරක්‍ෂා සහිත නිස්කලංක ග්‍රාමීය පරිසරය, නානකාමර සහිත කාමර තුනකින් සමන්විත, සියලු ගෘහභාන්ඩ සහ විදුලි උපකරණ සහිත නිවස. සාධාරණ මිළගණන් වලට. විස්තර සඳහා විමසන්න

Aruna : - 0407 119 138
E-Mail :- vistar7@yahoo.com.au

